ආරක්ෂක අමාත්‍යාංශය
ශ්‍රී ලංකා ගුවන් හමුදාව

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ III වන ශ්‍රේණියේ කාර්ය සහායක තනතුර සඳහා සිවිල් සේවකයින් ස්ථිර පදනමින් බඳවා ගැනීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්ය සහායක තනතුරේ දැනට පවතින පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත්‍ර මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව සකස් කොට අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන), ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර යන ලිපිනයට **2026.05.15 දිනට හෝ ඊට ප්‍රථම** ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය.

මූලික සුදුසුකම්

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු අතර තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින්ද විශිෂ්ට චරිතයකින්ද යුක්ත විය යුතුය.
- වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී එක් වරකදී විෂයයන් හයකට නොඅඩුව යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව සමත්වී තිබිය යුතුය.

සැ.යු. : අ.පො.ස (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපතක් අනිවාර්යයෙන්ම අමුණා එවිය යුතුය.

වැටුප්

- වැටුප් කේත අංකය : PL 1 – 2025
- වැටුප් පරිමාණය : රු. 40,000 - 10 × 450 - 10 × 490 - 10 × 540 - 12 × 590 - රු.61,880/-

සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා පැවැත්වෙන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ

ඇමුණුම

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ III වන ශ්‍රේණියේ කාර්ය සහායක තනතුර සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීම සඳහා වන ආදර්ශ අයදුම්පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) : .....
.....
2. මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) : .....
.....
3. ස්ථිර ලිපිනය : .....
4. උපන් දිනය : ..... ස්ත්‍රී / පුරුෂ භාවය .....
5. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු ..... මාස ..... දින .....
6. විවාහක/ අවිවාහක බව : .....
7. දිස්ත්‍රික්කය හා ළඟම ඇති පොලීසිය : .....
8. ජාතික හැඳුනුම්පත් අංකය : .....
9. දුරකථන අංකය : .....
10. අධ්‍යාපන සුදුසුකම් : .....
.....
(අ.පො.ස (සා/පෙළ) විභාගයේ ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපතක් මේ සමග අමුණා එවිය යුතු වේ)
11. වෘත්තීය සුදුසුකම් : .....
.....
12. වෙනත් කරුණු : .....
.....

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති සියලුම කරුණු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කර සිටින අතර, මෙහි සඳහන් කරුණු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

....

දිනය අයදුම්කරුගේ අත්සන

SELACINE

ගුවන් හමුදාපති